මේ'පුර අවුරුදු

"මේබිමේ පැවැත්වෙන සිංහල අවුරුදු උත්සව බොහෝ විට අප්‍රේල් මාසයට සීමා වෙයි. මැයි මාසයේ වැඩි පිරිසක් වෙසක් උත්සවය වෙනුවෙන් සූදානම් වන නිසාය ඒ....." පන්හිඳ "සන්නස"ට ලියන්න ඉඳහත්තා.

"එහෙත් විදේශ ගත වී සිටින අපගේ පිරිස් මැයි මාසයේ පවා සිංහල අවුරුදු උත්සව යොදා ගනිති. රැකී රක්ෂා කටයුතුවල නියැලී කාර්ය බහුලව සිටිනා ඔවුන් වැඩි පිරිසකට අස් වැසිල්ලක් ලැබෙනුයේ සති අන්තවලදීයි. ඊට අමතරව සවස් භාගයන් වලදී පොදු කටයුතු වෙනුවෙන් වෙහෙසෙන පිරිසක් ද වෙති. මේ හේතුව නිසාවෙන් ය අවුරුදු උත්සව මැයි මාසයේදීත් පැවැත්වීමට සිදුවන්නේ. ඒ නිසා-වෙන් ය ඒ පිළිබඳව යමක් ලියා පළකරන්නට අප හට ද පමා වන්නට සිදු වන්නේ...."

පන්හිඳටයි, පින්සලටයි, පැන්සලටයි අවුරුදු උත්සව ගණනාවකටම සහභාගිවෙන්න ඉඩ ලැබුණා. මුලින්ම බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසැලේ අවුරුදු උත්සවය ගැන කියන්න පින්සල උනන්දු වුණා.

උත්සවය තිබුණේ උදේ වරුවේ සිංහල ඉස්කෝලේ අනුශාසකත්වය දරන දිගාමඩුල්ලේ විමලානන්ද ස්වාමි-න් වහන්සේ බෙරික් පන්සලේ ඉඳන් උත්සවයට වැඩම කළා. උන්වහන්සේ පිරිසට පන්සිල් දීලා කරපු කෙටි දේශනයකින් පස්සේ කුඩා වේදිකාව උඩ තිබුණ පොල්තෙල් පහන දල්වලා උත්සවය පටන් ගත්තා. මේ වේදිකාව තිබුණේ එළිමහනේ. අවුරුදු චිත්‍ර යොදාගත්ත තිරයක් වේදිකාව පිටපස්සෙන් ඇඳලා තිබුණා.

මේ වේදිකාව ඉදිරිපිට ගිනි මොළවලා කිරි උතුරවන්න ළිපකුත් සූදානම් කරලා තිබුණා. ඉස්කෝලේ කුඩා දරු දැරියෝ ගුරුවර ගුරුවරියෝ වටවෙලා ළිප ගිනි මෙළෙව්වා. ඒ අතරේ තවත් බවලත්තු කණ්ඩායමක් රබන් වාදනය කළා. ඒ අයට අර දරුවනුත් එක් වුණා. ඉන් පස්සෙ හැමෝම තමන්ගේ පන්ති කාමරවලට ගියේ තවත් සිරිතක් කරන්න. හැම දරුවෙක්ම තමුන්නේ ගුරුවරයාට හරි ගුරුතුමිට හරි බුලත් දීලා වැන්දේ පන්ති කාමරය ඇතුලෙදි. හැමෝම සූදානම් කරලා තිබුණ කෑම මේස වටේ එකතුවෙලා අවුරුදු කෑම රස විත්දා. ඊට පස්සෙයි අවුරුදු ක්‍රීඩා පටන් ගත්තේ. ඒ වෙනුවෙන් පිටිටනිය සූදානම් කරලා තිබුණා... සුපුරුදු සිංහල අලුත් අවුරුදු ක්‍රීඩා සෑහෙන ප්‍රමාණයක් වැඩ සටහනට ඇතුලත් වුණා.
උත්සවයට සූදානම් කරල තිබුණ ආරාධනා පත්‍රයත්, වැඩසටහන් පත්‍රයත්, වේදිකා සැරසිල්ලත් සිංහලකම පෙන්නන චිත්‍රවලින් සැරසිල තිබුණා.

ඩැංඩිනොං ධම්ම දීප දහම් පාසලේ සිංහල අවුරුද්ද සැමරුවේ ප්‍රසංගයක් විදියට. රිච්මන්ඩ් පර්ෆෝමිං ආර්ට් සෙන්ටර් එකේ තිබුණ ඒ සිංහල අවුරුදු ප්‍රසංගයට ගියේ පැන්සල. ඒ ගැන කියන්න පැන් ඉදිරිපත් වුණා.

සිසිර දිසානායක

ගැන ලිව්වේ මෙහෙමයි:

සවස් භාගය පුරාවට එළිමහන් පිටියේ පැවැත්වුණ අවුරුදු ක්‍රීඩා සඳහා වෝ මෙන්ම වැඩිහිටියෝද උනන්දුවෙන් සහභාගි වූහ. ඉන් අනතුරුව පැවැත්වුණ ගෘහස්ථ තරඟ සඳහා ඇරඹුම ලබා දුන්නේ අවුරුදු කෑම මේසයයි. මිනෝලි හා නනාෂා දේවගේ දැරියන් ඉදිරිපත් කළ භාරත නර්තනයත්, සමූහ ළමා ගීතයත් අප සිත් ගත්තේය. විකට ඇඳුම් තරඟය මෙන්ම සිඟිත් අවුරුදු කුමාරිය, සිඟිති අවුරුදු කුමාරයා තරඟ ද දරුවන්ගේ සුරතල් ගති විදහා දක්වන තරඟ විය. සිඩිනිවල සිට පැමිණි දිනේෂ් පෙරේරා නර්තනාචාර්යවරයාගේ ඉදිරිපත් කිරීමිද සිත් ගත්තේය.

අනතුරුව පැවැත්වුණු අවුරුදු කුමාරයා හා අවුරුදු කුමරිය තේරීමේ තරඟ තරුණ තරුණියන් මතු නොව වැඩිහිටි පිරිස්වලද උනන්දුව වඩාලීය. අවසන සංගීත සාදයක් ද විය.

මෙම කටයුතු මෙහෙය වන ලද්දේ ශ්‍රීනාත් මද්දුමගේ රංගන ශිල්පියා සහ ජගත් ජේ. එදිරිසිංහ ගත් කතුවර කවියා විසිනි. ඊට තුෂාර යොවනයාද සම්බන්ධ විය.

"කිස්බරෝ ධම්ම සරණ විහාරස්ථානයේ සිංහල ළමා සාරියෙන් සැරසුණ දැරියකුයි ජාතික ඇඳුමකින් සැරසුණ දරුවෙකුයි පිළිගැනීමේ කතාව කළාට පස්සේ දොරට වැඩුමේ පහන් පූජා නැටුමකින් තමයි පහන් දැල්වීම කළේ. "කොහෝ කොහෝ", "මේ අවුරුදු කාලේ", "අවුරුද්දක්" වගේ ගීතවලට කරපු රංගන වගේම " නොනගතයට පන්සල් යමු", "සූර්ය සංක්‍රාන්තිය", "කොප්පර කොප්පර පිපිඤ්ඤා", "රබන් සුරල්", " අවුරුද්දට නෑ ගම් යමු" වාගේ අංගවලටත් දරු දැරියන් ඉදිරිපත් කරපු රංගන හොඳින් පුහුණු කරලා තිබුණා. "අවුරුද්දට කැවිලි හදමු", " ඔන්චිලි වාරම්", "ඔළිඳ කෙළිය", වාගේ අංග ඉදිරිපත් වුණේ නැටුම් විදියට. මේ හැමදේකින්ම දරුවන්ගේ කුසලතා ඉස්මතු වුණා.

විහාරාධිපති පූජ්‍ය අකරවිට සංඝානන්ද ස්වාමීන්වහන්සේගේ දේශනය කුඩා ළමයින්ට උචිත ආකාරයට කවි ගායනයක් ද සමගින් කළ අතර "රෝම මලේ නටුවෙ කටු" කවිය උන්වහන්සේගේ දේශනයට පාදක වුණා. දයා විජේවර්ධන මහත්මිය ප්‍රධානාචාර්යවරිය වශයෙන් අවුරුදු 20ක කාලයක් කටයුතු කිරීම මෙගිදී අගැයීමට ලක්කිරීම විශේෂ කාරණාවක්. ප්‍රසංගයේ ඇඳුම් සකස් කර ගැනීම ගුරුමණ්ඩලය විසින්ම කළ බවයි දැනගන්න ලැබුණේ. ජගත් ධර්මසේන මහත්මයා පසුතල නිර්මාණ කළාලු. රංගන පාසැලේ දරුවන්ගේ අවුරුදු උත්සවය නැවුම් මුහුණුවරක් ගත්තේය." පන් තවදුරටත් ලියාගෙන ගියා.

"පාසැලේ පන්ති පහට අනුව, "ඉහළ ගෙදර", " පහළ ගෙදර", "ලන්දෙ ගෙදර", "කන්දෙ ගෙදර" සහ "මෙලේ ගෙදර" නමින් කුඩා තිවාස පහක් විහාරස්ථානයේ පසු පස භූමිභාගයේ ඉදිවී තිබිණ. ඒ ඒ තිවසේ ගෘහ මූලිකයා වූයේ පන්ති භාර ගුරුතුමා හෝ ගුරුතුමියයි. මුලින් ම කළේ අසල් වැසි තිවාස පහේ පිරිස "නොනගතය වෙලාවේ පන්සල් යාමයි. පාසැල් අනුශාසක ධූරය දරන විහාරයාධිපති පූජ්‍ය නාඔටුන්නේ විජිත ස්වාමීන් වහන්සේ පිරිස පංචශීලයෙහි පිහිටුවා ආගමික වතාවත් කොට අනුශාසනාවක් ද පැවැත්වූ සේක. ඒ වෛත්‍ය අභිසයයි.

ආපසු නිවාසවලට පැමිණි ඒ ඒ පන්තිවල දරු දැරියෝ තිවෙස්වල වූ පහන් දැල්වූහ. ඒ ප්‍රධාන පහන ආරාධිතයින් දැල්වීමෙන් අනතුරුවයි. ගෘහමූලිකයා විසින් තම තමන්ගේ තිවසේ දරු දැරියන්ට කිරිබත් කට බැගින් කැවීමෙන් අනතුරුව ඒ ඒ දරු දැරියෝ ගෘහමූලිකයාට බුලත් දී වැන්දය. කෑම අනුභවයෙන් පසුව කැවිලි පිගන් අසල් වැසි තිවෙස්වලට ගෙන යනු දක්නා ලදී ගිස තෙල් ගානු ලැබුයේ ද ඒ ඒ තිවෙස්වල ගෘහමූලිකයා වූ පන්තිභාර ගුරුබවතුන් විසිනි. ඒ අතරේදී විශේෂයෙන් සකස් කළ ස්ථානයක දරුවකුගේ හා දැරියකගේ ගිස තෙල් ගානු ලැබුයේ නායක ස්වාමීන් වහන්සේ විසිනි. ඉතට කොළ ඉති එල්ලා, පයට කොළ ඉති ඇතිරූ ස්ථානයකි ඒ. මේ සිරිත් ඉටු කිරීමෙන් පසුව අවුරුදු උත්සව වල විරල "කොප්පර කොප්පර පිපිඤ්ඤා", "එළුවන් කෑම", "මේවර කෙළිය", රබන් වැයීම යනාදිය සියල්ල එක්ව ක්‍රීඩා කළහ. ඉන් අනතුරුවයි සුපුරුදු ක්‍රීඩාවලට යොමු වූයේ. මෙගිදී ද ගුරුභවතුන්ගේ හා දෙමව්පියන්ගේ සහය පිළිබඳව සිහිපත් කළ යුතුවෙයි.

මෙවරත් සුපුරුදු පරිදි ශ්‍රී ලංකා - ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍යයින් සංවිධානය කරන මහා අවුරුදු උළෙල ඉතා උත්කර්ශවත් අන්දමින් පැවැත්විණ. ඊට 10,000 පමණ පිරිසක් දවස පුරා සම්බන්ධ වූ බව අසන්නට ලැබිණ. පන් ලියවිල්ල හමාර කළා.

LEARN JAPANESE

By a Qualified Experienced Teacher
(Northern Suburbs).

PREP to VCE
Help in essay writing, exam tips, conduct mock tests and preparation for VCE oral exam.

Individual classes for reasonable rates.
Contact: 0425396975

Australian Government
Department of Immigration and Citizenship

Funding for the Building Multicultural Communities Program

Applications are invited for funding under the Building Multicultural Communities Program (BMCP) 2013-14.

The BMCP aims to empower communities to embrace the benefits of multiculturalism and maintain cohesive and socially inclusive neighbourhoods.

The BMCP will provide one-off funding to eligible Australian not-for-profit, incorporated community organisations, and local government authorities that provide services and key support to their community groups, for projects that enhance multicultural community spaces through infrastructure, equipment and capital works.

Applications must be lodged electronically by **5.00 pm AEST Friday 28 June 2013**. Applications received after 5.00 pm AEST will not be considered.

More information, including the applicant information booklet and how to apply, is available online at **www.immi.gov.au/BMCP**

For enquiries, phone the helpdesk on 1800 453 004 between 9.00 am to 5.00 pm AEST Monday to Friday (excluding ACT public holidays).

AG75369

One APS Career ... Thousands of Opportunities
people our business